අන්තෝ ජටා

රටේ ආරක්ෂාව පෙරට දමමින් රජයේ පැවැත්ම උදෙසා ගන්නා වූ ආරක්ෂක ක්‍රියාමාර්ග හරහා ජනතාවගේ මිනිස් අයිතිවාසිකම් අහිමිවීමේ කාරණාව තුන්වන ලෝකයේ ජීවත්වුණ අපට බොහෙම හුරු පුරුදු දෙයක්. මානුෂික අයිතිවාසිකම් කියන එක තුට්ටුවකටවත් සළකන්නෙ නැති නිසාතෙ ශිෂ්‍යයන්ගෙඉඳල ඉහළ වෘත්තිකයන් දක්වාම කට්ටිය මෙහෙටම අණෝ ලහගෙන පර්මනන්ට සෙට් වෙන්න දගලන්නෙ. දැන් ඉතින් මෙහෙත් ඒ හොඳ කාලෙ අවසන් වේගනද යන්නෙ? බොහෝ දෙනක් බලන් ඉන්නෙ සැකෙන් බයෙන්. දෙයියනේ කියල කියක් හරි හම්බ කරගෙන පවුල් පන්සල් වලා දරුවන්ටත් උගන්වලා ලංකාවටත් කියක් හරි යවාගෙන ගිටපු අපට මේ බුර්කාවක් නිසා සිද්වෙලා තියෙන්නෙ බයෙන් ඉන්න.

මේක නම් මාර අවුලක්. චූටි මල්ලි ඉන්නෙ නිකං තෝන්තු වෙලා වගෙ. මොකද වටේට ආශ්‍රය කරන සිංහල දෙමහල මිස්ලිම් මිත්‍රයොත් අවුල් වෙලා මේ කතන්දරේ නිසා.

මේකට හේතුව මොකක්ද? මත දෙකක් තියෙනවා. අපේ වැඩපොලේ නිෂාමි ල කියන්නෙ "මචං මේක අපේ සංස්කෘතියෙ එක කොටසක්. මේ වගේ ප්‍රජාතන්ත්‍රවාදී රටක උඹල හැම එකෙක්ම එක අච්චුවට දාල අසාධාරණ විදිහට අපේ අයිතියට අපහාස කරන්නෙ ඇයි?"

එතකොට අනිත්පැත්තෙන් කපිලල කියන්නෙ "මචං අපි දෙයියනේ කියලා හිටියා. මුං මේකත් ඉරාකයක් කරන්න හදන්නෙ. මචං ඇස් දෙක විතරක් පේන්න අඳින්නෙ නැතුව ඕක මුණ පේන්න ඇන්දම ඉවරයිනෙ. එතකොට අපි දන්නවනේ ඇඳුම අතුලෙ ඉන්නෙ මිනිහෙක්ද ගැනියෙක්ද කියල. ඒක කාටත් හොඳයිනෙ. ඇඟම වහගෙන මූනට ඕන්නම් වේල් එකක් දාල වහගෙන ගියා නම් අපේ ගින්දරත් නිවෙනවානෙ. ඇයි ඒක කරන්න බැරි." කියල.

මේ මානෘකාව ගැන වැඩපොලේ මාර බර බරයක්. මාත් හිතුව මේ ගැන මගේ චූටි මොළෙන්.

සංස්කෘතියත් බැහැර නොකර ප්‍රජාතන්ත්‍රීය අයිතිවාසිකමුත් රැකගෙන රටේ මිනිස්සුන්ගෙ පපුවෙ ගින්දරත් නිවාගෙන මේක විසඳ ගන්නෙ කෙහොමද?

චූටි මල්ලි කවදත් මිනිස්සුන්ගෙ අයිතිවාසිකම් වලට පක්ෂයි. ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම වෙනුවෙන් කොන්දේසි විරහිතව පෙනි සිටිනවා. එතකොට මේ බුර්කා අවුලට මොකද කරන්නෙ? හැමදාම වගේ අන්තිමටම කතා කරන අපේ වැඩිහෙල් මිත්‍රයා නම් කිව්වෙ "මචං මෙහෙම කරමු. බුර්කාව ඇඳගෙන තමන්ගේ සමාජීය සංස්කෘතික කටයුතු වලට යනවා. ඒ තමන්ගෙ කොමියුනිටි එක ඇතුළෙ. ඒත් පොදු ස්ථාන වලට යනකොට තමන් කවුද කියලා අනෙකාට දැනෙන විදිහට මූණ තිරාවරණය කරගෙන යනවා."

මං හිතුවෙ ඒකනම් හොඳයි. ඒත් ඉතින් බෝම්බයක් ගේනවා නම් බඩේ බැඳගෙනනෙ එන්නෙ? ඒකට මොකද කරන්න?

හ්මම්.....

තව ටිකක් හිතලා බලමු.

වේ නැති වේ සැමරීම

මේ දවස්වල ලංකාවෙ වේ සමරණව. වෙනදට වඩා උත්සවාකාරයෙන්. කාලෙන් කාලෙට මේ සැමරීම වෙනස් වෙනවා. රටේ ප්‍රශ්න මතුවෙනකොට ගැටලු වැඩි වෙනකොට වේ ට ඇති ඉල්ලුම වැඩියි.

කෝම හරි මේ වගේ අසාමාන්‍ය මිනිසෙක් වසරකට වරක් හෝ සැමරීම වැදගත්. වඩා වැදගත් වන්නේ ඔහු අනුගමනය කිරීම බව මට බොහොම කාලෙකට ඉස්සෙල්ල කියල දුන්නෙ අපේ පොඩි අයියා. සාමාන්‍යයෙන් වේගෙ රූපය හැම තිස්සෙම රැඩිකල් බවත් එක්කතෙ සමපාත වන්නෙ. සම්මතයට එරෙහිව යන විකල්ප මත දරන හැමෝගෙම සංකේතයනෙ වේ.

ඉස්සර අපේ ගෙදර ඉස්සරහ කාමරය වෙන් වෙලා තිබුණෙ අයියලගෙ වැඩ වලට. අපේ පවුලට තිබුණෙ වාමාංශික නැඹුරුවක් නිසා මාක්ස්ල ලෙනින්ල පිලිප්ල කොල්විල්ල විජේවීරල අපට අමුත්තන් නෙවෙයි. මේ හැම කෙනෙක් ගැනම දළ අවබෝධයක් ඒ කාලෙ තිබුණා. ඒ කාලෙත් මට වැඩියම සමීප වුණේ වේ. මං හිතන්නෙ ඒ ඔහුගෙ පෞරුෂය නිසා. මං වේගෙ අර ලෝක ප්‍රසිද්ධ ෆොටෝ එක තියෙන පෝස්ටරේ මගේ කාමරේ

බිත්තියේ ගහගෙන හිටියා. හැබැයි පට්ට විදිහට දේශපාලනය කළ අයියලගේ කාමරේ නම් තිබුණෙ බුදු පිළිමෙකුයි පොතුයි පත්තරයි විතරයි.

කාමරේ වේ හිටියට අපේ වැඩ කොලු කාලෙ ආයෙ කියන්න දෙයක් නෑනෙ. පිස්සුවේ උපරිමයට ගිහින් තවත් අගලක් එහාට ගිය කාලයක් ඒක. ඒ කාලෙ මං තවපු නාඩමක ප්‍රතිඵලයක් විදියට පොලිස් කූඩුවේ හිටියා රැයක් (ඒ කතාව පස්සෙ කියන්නම්)

ඊට පහුවෙනිදා තමයි අපේ පොඩි අයියා මට පැය එකහමාරක කන්ද උඩ දේශනාව කළේ. අන්තිමට එයා ඒක අවසන් කළේ

"එලියෙ මහ ලොකුවට වේගෙ පෝස්ටරේ තිබුණට වැඩක් නෑ. අඩුම ගානෙ මේ මිහිනා කවුද මොනාද කළේ කියලා ඉගෙනගනින්. නැරත්තම් ඔක ගලවලා බෑස් ලී ගෙ පින්තූරයක් අරගෙන ගහගනින්."

කොහොම හරි මේ ටෝක් එක මගේ ජීවිතේට ගොඩක් බලපෑවා. වේ කවුද මොනවද කළේ කියන එක මං වගේම ඒ කාලේ අපේ පරම්පරාවෙ කවුරුත් දැනගෙන හිටියෙ නෑ. නුගක් දෙනෙක් දැනගෙන හිටියෙ ඔහු අසාමාන්‍ය නිර්භීත සටන් කරුවෙක් විදිහට විතරයි.

ඇත්කටම ඔහු ගැන කොරතුරු අඩංගු පොත් පත් සඟරා ඕගිවුණෙ අනුව දශකය අවසාන කාලෙ විතර මං හිතන්නෙ. සැබෑවටම ඔහු සහ ඔහුගෙ කාර්යභාරය පිළිබඳව දැනගන්නෙ 2000 දශකයෙදි.

ඒ අවබෝධය මට මගේ ජීවිතේ හැඩගස්සගන්න බොහොම උපකාර වුණා. ගරිල්ලා සටන් නායකයකු නිර්භීත විප්ලවවාදියකු ශ්‍රේෂ්ට චින්තකයකු මහා ශූර ලේඛකයකු ලෙස ඔහු කළ කාර්ය භාරය ගැන හෝ කියුබන් විප්ලවය ගැන ලියන්න මම උත්සුක වෙන්න නැහැ. ඒවා අඩ සිය වසකට ආසන්න කාලයක් තිස්සෙ නැවත නැවත ලියැවෙමින් තිබෙන නිසා.

මේ සියළු දේට වඩා වේ සඳාකල් මගේ ගෞරවය පාත්‍ර වන්නේ සැබෑ විප්ලවවාදියකු වීමට කිසිවකු පොළොඹවනු ලබන්නේ ඒ පුද්ගයා තුළ පවත්නා ආදරය පිළිබඳ දැඩි හැඟීම විසින් බවත් සෑම විප්ලවවාදියකුම ආදරයෙන් හා දයාවෙන් හා කරුණාවෙන් පිරි මනුෂ්‍යයන් විය යුතු බවත් වේ දැඩි ලෙස විශ්වාස කළ නිසයි.

ඒ හැඟීම් නැති කිසිවකු සැබෑ විප්ලවවාදියකු වන්නෙ නැහැ.

හපොයි... තවත් පාටියක්...

බර්ත් ඩේ පාටි
හතළිහෙ පාටි
පනහෙ පාටි
නෝනගෙ සර්ප්‍රයිස් පාටිය
මහත්තයගෙ සර්ප්‍රයිස් පාටිය
දුවගෙ විසි එකේ පාටිය
බැඳල විසි පහේ සංවත්සරපාටිය
පාටි
පාටි
පාටි

ගිය සුමානෙ ගියා අපේ හොඳ මිත්‍රයෙකුගෙ සංවත්සරයට. බැඳලා අවුරුදු 25යි. ඒක නම් මාර පාටියක්. තිබුණා ලොකු හෝල් එකක. බෑන්ඩ් එකකුත් ගැහුවා. වැඩේ ගෘන්ඩ්. ප්‍රශ්නෙ තියෙන්නෙ ගෘන්ඩ් එක නෙවෙයි පාටියත් නෙවේ පාටියට මැච් වෙන විදිහට අපි සෙට් වෙන එකයි.

සෙට් වෙනවා කියලා එහෙමට සෙට් වෙන්න පුලුවන්ද? හෝල් එකක ගෘන්ඩ් පාටියක් තියෙනකොට මට නම් තියෙන බාච්චුවක් දාගෙන යන්න පුවුවන්. ගෙදර අයට එහෙම පුලුවන්ද? තියපොතු වල ගාන පාට වල ඉඳලා ඇඟි බැම හදාගන්න යනකල්ම ලොකුම වියදමක්නෙ.

ඊට පස්සෙ යාලුවගෙ හිත සැනසෙන විදිහේ තෑග්ගකුත් ගන්න ඕනෙ. ඒකත් කළා කියමුකෝ. ඊට පස්සෙ මේ සුමානෙ ඒ යාලුවගෙම දූගෙ ටුවෙන්ටි ෆයිව් බර්තක් ඩේ පාටි එක. එකම දූ නිසා ඒකත් ගෘන්ඩ් එකට ගන්නවා. අපි මේ හැම දේම කරන්න දරුවො සතුටු කරන්නනෙ.

එතකොට ආපහු මුළු ඉඳලා ඒ පාටියටත් සෙට් වෙන්න අපට සිදුවෙනවා.

එතකොට තව ආරාධනාවක් ඇවිල්ලා තියෙනවා

ළඟින්ම ආශ්‍රය කරන තවත් යාලුවෙක්ගෙ පනහෙ බර්ත් ඩේ එක. මේ හැම දේම අපේ යුතුකම් බවට පත්වෙලා තියෙනවා.

එක මාසෙට පාටි හතරක් ආවොත් සාමාන්‍ය පඩියක් ගන්න මිනිහෙකුගෙ වියදම හිතා ගන්න පුලුවන්ද . මට මතක් වෙන්නෙ ලංකාවෙ කාර්යාලයක වැඩ කරන ලිපිකරුවෙකුගෙ ජීවිතය . මළ ගෙවල් මගුල් ගෙවල් කොටහළු ගෙට ගෙවදීමි. ඒ හැම එකටමත් ආරාධනා. නොගිහින් බැහැ. අපි හොඳින්ම දන්න දෙයක් තමයි ලංකාවෙ මිනිහෙකුට එක මාසෙකට ආරාධනා 4ක් ආවොත් ඒක දරාගන්න බැරි බව. එතකොට එහෙයි මෙහෙයේ වෙනස මොකක්ද?

දැන් මේ පාටි දැමිල්ල අපේ සමාජයේ උප සංස්කෘතියක් බවට පත්වෙලා . පාටියක් කියන එකේ අදහස වෙනත්නෙ තමන්ට හිතවත් කීපදෙනෙක් එකතු වෙලා පොඩි විනෝදයක් ලැබීම. ඒත් දැන් පාටි කියන්නෙ මහා පරිමාන උත්සව වෙලා. ඒක වදයක් වෙනවා නම් ඒ දාන පාටියෙන් ඇති පලේ මොකක්ද?

අපි මේක වෙනස් කරන්නෙ කොහොමද?

පාටිවලට නොගිහිල්ලත් බෑ නොගැලපෙන තෑගි දීලත් බෑ. අතික් අතින් මිත්‍රත්වය රැක ගන්නත් ඕනෑ. සමාජ තත්වය රැක ගන්නත් ඕනෑ. දැන්නම් මේ පාටි දැමිල්ල මාර උහතෝකෝටිකයක් වෙලා.

මේක කිව්ව කියලා චූටි මල්ලි එක්ක තරහ වෙන්න එපා. තම තමන් කරන දේවල් දිහා නැවත හැරී බලන්න කියලයි මම කියන්නෙ.

අර මහා පරිමාන පාටි වලට වඩා යාලුවො දෙතුන් දෙනෙක් එක්ක හවහට සෙට් වෙලා නෝන හදල දෙන රස බයිට් එකක් එක්ක හිඟියට යමක් කරගෙන පුංචි කතා බහක යෙදිලා අතීතය ස්මරණය කරන එක කොයි තරම් රසවත්ද? අම්මපා එහෙම සතුටක්. මතක් කරනකොටත් සන්තෝසයි. අන්න පාටි.

ඔබ නැතුව ඔබ එක්ක සහ මහින්දාගමනය

මිනිස්සු කලා කෘතියක රස විඳින්නෙ කොහොමද කියල කවුරු හරි ඇහුවොත් ඒකට නිශ්චිත පිළිතුරක් දෙන්නේ කොහොමද කියල කියන්න මට නම් අපහසුයි. සමහරවිට ඒක දැනුම මත අවබෝධය හා අත්දැකීම් මත වෙනස් වෙන්න ඉඩ තියෙනවා. ඒ ඒ අයගේ මට්ටම් අනුව රස විඳීම වෙනස් වන්නටත් වර්ගීකරණය වන්නටත් ඒ නිසා රසවිඳීම සාපේක්ෂ දෙයක් කියලයි මට අවබෝධ වෙන්නෙ.

කොහොමත් නිර්මාණ රස විඳීම කියන එක ඉබේ ගොඩනැගෙන දෙයක් නෙවෙයි. එය ගොඩ නගා ගත යුතු දෙයක් කියලයි දන්නෝ කියන්නෙ. ඒ ගොඩ නගා ගැනීම සඳහා ඔවුන්ගෙ සංස්කෘතික ජීවිතය ඉතා වැදගත් වෙනවා. කියවීම සංචාරය පරිශීලනය සාමූහික බව නුවමාරුව වැනි දේවල් වැදගත්. ඒ වුනාට මේ සියුලම දේවල් කරන්න

මිනිස්සුන්ට මුලිකව නිදහස අවශ්‍ය වෙනවා. ඒ නිදහස නැතිව මිනිස්සු අර ඉහත කී කාරණා වලින් වියෝ වෙනකොට ඉබේම මොට වෙනවා. එතකොට මිනිස්සු දකින්නෙ ගැඹුර නෙවෙයි මතුපිට. ඒ නිසා තමයි චායල දේදුණු ල හැඟල යන්නෙ.

ලංකාවෙ මිනිස්සුන්ගෙ ජීවිතය ගැන දන්න අපි එක අතකට කොහොමද දොස් කියන්නෙ. ඒත් ඉතින් භෞතික ජීවිතයේ සියලුම අවශ්‍යතා ඉටු කරගෙන සුව පහසු නිදහස් ජීවිතයක් මෙහෙ ගත කරන මිනිස්සුන්ටත් රස විඳීම ගැන අවබෝධයක් ලබා ගන්න බැරි අයි කියන එක ප්‍රශ්නයක්. මෙහෙ උසස් නිර්මාණ නැද්ද? මානුෂික අයිතිවාසිකම් නැද්ද? ප්‍රජාතන්ත්‍රවාදය නැද්ද? මේ ඔක්කොම තිබිලත් රස විඳීම වර්ධනය කරගන්න උත්සාහ නොගෙන අවර ගණයේ නිර්මාණ පසුපස යන්න හුරු වෙලා තියෙන්නෙ ඇයි?

සාමාන්‍ය මිනිස්සු නම් කමක් නැහැ. කලාකරුවන් හැටියට පෙනී ඉන්න අයත් පිස්සු ලියනකොට හරිම කණගාටුවක් කළකිරීමක් තමයි දැනෙන්නෙ. විශිෂ්ට නිර්මාණකරුවෙක් අමාරුවෙන් ලබාගත්ත දැනුමෙන් සමාජයට ජීවිතය පිළිබඳ අර්ථයක් දෙන්න නිර්මාණයකින් උත්සාහ කරනකොට ඒක දුගඳ හමන නරා වලක් ඉසීමක් ලෙස හඳුන්වන කලාකරුවන් ගැන මොන කතාද? මේ අයගෙ රසඥතාව කොතනද තියෙන්නෙ කියල පේන්නවනෙ.

චූටි මල්ලි